（シンハラ語）

# 難民等認定手続案内

## සරණාගතයින් ආදීන් හඳුනාගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ මාර්ගෝපදේශය

【第 6 版】

[6 වන සංස්කරණය]

2024 年 12 月

2024 දෙසැම්බර්

出入国在留管理庁

ආගමන විගමන සේවා නියෝජිත ආයතනය

# はじめに
## හැඳින්වීම

難民認定手続案内（第 1 版）は、我が国の難民の地位に関する条約等への加入に伴い、難民認定手続を整備するため、1981 年に一部改正された出入国管理及び難民認定法を基に編集したものです。

සරණාගතයින් හඳුනාගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ මාර්ගෝපදේශය (1 වන සංස්කරණය) යනු, ජපානය සරණාගතයින්ගේ තත්ත්වය පිළිබඳ සම්මුතියට ඇතුළත් වීමෙන් පසුව, සරණාගතයින් හඳුනාගැනීමේ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම සඳහා 1981 දී සංශෝධනය කරන ලද ආගමන විගමන පාලන සහ සරණාගතයින් හඳුනාගැනීමේ පනත මත පදනම්ව සම්පාදනය කරන ලද්දකි.

その後、2004 年 6 月 2 日に公布された、仮滞在許可制度及び難民審査参与員制度の創設を内容とする「出入国管理及び難民認定法の一部を改正する法律」の内容を基に、加筆・修正を加えて第 2 版を発行、一時庇護手続について記載した第 3 版を発行、2009 年 7 月 15 日に公布された、新たな在留管理制度の導入を内容とする「出入国管理及び難民認定法の一部を改正する法律」の内容を基に加筆・修正を加えた第 4 版を発行、2016 年 4 月 1 日に施行された、不服申立ての手続を審査請求に一元化することなどを内容とする行政不服審査法の全部改正を受けて第 5 版を発行してまいりました。

ඉන් අනතුරුව අපි තාවකාලික රැඳී සිටීමේ බලපත්‍ර ලබාගන්නා ක්‍රමවේදය සහ සරණාගත පරීක්ෂණ උපදේශක ක්‍රමවේදය ස්ථාපනය කරමින් 2004 ජූනි 2 වන දින ප්‍රකාශයට පත් කරන ලද “ආගමන විගමන පාලන සහ සරණාගතයින් හඳුනාගැනීමේ පනත අර්ධ වශයෙන් සංශෝධනය කිරීමේ රෙගුලාසියේ” අන්තර්ගතය මත පදනම්ව, එකතු කිරීම් සහ සංශෝධන සහිතව දෙවන සංස්කරණය පළ කළෙමු. තාවකාලික සරණාගතභාවය ලබාගැනීමේ ක්‍රියාවලි  පැහැදිලි කරමින් එහි තුන්වන සංස්කරණය ප්‍රකාශයට පත් කළ අපි, පදිංචිවීම් පිළිබඳ නව කළමනාකරණ ක්‍රමවේදයක් හඳුන්වා දෙමින් 2009 ජූලි 15 වන දින ප්‍රකාශයට පත් කරන ලද “ආගමන විගමන පාලන සහ සරණාගතයින් හඳුනාගැනීමේ පනත අර්ධ වශයෙන් සංශෝධනය කිරීමේ රෙගුලාසියේ” අන්තර්ගතය මත පදනම්ව, එකතු කිරීම් සහ සංශෝධන සහිතව, සිව්වන සංස්කරණය ද ප්‍රකාශයට පත් කළෙමු. 2016 අප්‍රේල් 1 වන දින සිට බලාත්මක කරන ලද්දා වූ ද, සමාලෝචනය සඳහා වන ඉල්ලීම්වලට අභියාචනා ක්‍රියාවලි ඒකාබද්ධ කිරීම ඇතුළත් වන්නා වූ ද පරිපාලන අභියාචනා පනතේ සම්පූර්ණ සංශෝධනයට ප්‍රතිචාර වශයෙන් 5 වන සංස්කරණය ද අප විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිණි.

今般、2018 年 12 月 14 日に公布された、出入国在留管理庁の設置等を内容とする、「出入国管理及び難民認定法及び法務省設置法の一部を改正する法律」及び 2023 年 6 月 16 日に公布された、補完的保護対象者認定制度の創設等を内容とする、「出入国管理及び難民認定法及び日本国との平和条約に基づき日本の国籍を離脱した者等の出入国管理に関する特例法の一部を改正する法律」の内容を基に加筆・修正を加えた第 6 版を発行するものです。

මෙවර සිදු කරන ලද 6 වන සංස්කරණය වනාහි, ආගමන විගමන සේවා නියෝජිත ආයතනය පිහිටුවීම ආදිය ද ඇතුළත් කරමින් 2018 දෙසැම්බර් 14 වන දින ප්‍රකාශයට පත් කරන ලද “ආගමන විගමන පාලන සහ සරණාගතයින් හඳුනාගැනීමේ පනත සහ අධිකරණ අමාත්‍යාංශය ස්ථාපිත කිරීමේ පනත අර්ධ වශයෙන් සංශෝධනය කිරීමේ රෙගුලාසියේ” ද, අනුපූරක ආරක්ෂණ සුදුසුකම් ලැබූ පුද්ගලයන් හඳුනාගැනීමේ ක්‍රමවේදය ස්ථාපනය කිරීම ආදිය ඇතුළත් ද කරමින් 2023 ජූනි 16 වන දින ප්‍රකාශයට පත් කරන ලද, “ආගමන විගමන පාලන සහ සරණාගතයින් හඳුනාගැනීමේ පනත සහ ජපානය සමඟ සාම ගිවිසුමට අනුව ජපන් ජාතිකත්වය ඉල්ලා අස් කර ගත් පුද්ගලයින්ගේ ආගමන පාලනය පිළිබඳ විශේෂ පනත අර්ධ වශයෙන් සංශෝධනය කිරීමේ රෙගුලාසියේ” අන්තර්ගතය මත පදනම්ව, එකතු කිරීම් සහ සංශෝධන සහිතව, යාවත්කාලීන කරන ලද්දකි.

2024 年 12 月

2024 දෙසැම්බර්

出入国在留管理庁

ආගමන විගමන සේවා නියෝජිත ආයතනය

目次

පටුන

第 1　日本の難民認定制度及び補完的保護対象者認定制度の概要 ........................................1

1 වන කොටස　ජපානයේ සරණාගතයකු හඳුනාගැනීමේ ක්‍රමවේදය සහ අනුපූරක ආරක්ෂණලාභියකු හඳුනාගැනීමේ ක්‍රමවේදය පිළිබඳ දළ විශ්ලේෂණය ........................................1

第 2　難民の認定又は補完的保護対象者の認定を受けた外国人が 享受できる利益 ........................................3

2 වන කොටස　සරණාගතයින් ලෙස හෝ අනුපූරක ආරක්ෂණලාභීන් ලෙස හඳුනාගනු ලැබ ඇති විදේශිකයින්ට ලබා ගත හැකි ප්‍රතිලාභ ........................................3

1　永住許可要件の一部緩和 ........................................3

1　ස්ථිර පදිංචිය සඳහා අවසරය ලැබීමට සැපිරිය යුතු කොන්දේසි අර්ධ වශයෙන් ලිහිල් කිරීම ........................................3

2　難民旅行証明書の交付（難民の認定を受けた外国人に限ります。） ........................................3

2　සරණාගත සංචාරක ලේඛනයක් නිකුත් කිරීම (සරණාගතයින් ලෙස හඳුනාගනු ලැබ ඇති විදේශිකයින් සඳහා පමණි)..3

第 3　難民等認定手続 ........................................5

3 කොටස　සරණාගතයින් ආදීන් හඳුනාගනු ලැබීමේ ක්‍රියාවලිය ........................................5

1　申請手続 ........................................5

1　අයදුම් කිරීමේ ක්‍රියාවලිය ........................................5

(1)　申請期間 ........................................5

(1)　අයදුම් කිරීමේ කාලසීමාව ........................................5

(2)　申請窓口 ........................................5

(2)　අයදුම් කිරීමේ කවුළුව ........................................5

(3)　申請に必要な書類 ........................................5

(3)　අයදුම් කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ........................................5

(4)　難民又は補完的保護対象者であることの立証 ........................................8

(4)　සරණාගත තත්ත්වය පිළිබඳ හෝ අනුපූරක ආරක්ෂණය ලැබීමට සුදුසු බවට තහවුරුව ........................................8

2　仮滞在の許可 ........................................8

2　තාවකාලික රැඳී සිටීමේ අවසරය ........................................8

(1)　仮滞在許可による滞在 ........................................9

(1)　තාවකාලික රැඳී සිටීමේ අවසරය මත රැඳී සිටීම ........................................9

(2)　仮滞在許可書 ........................................9

(2)　තාවකාලික රැඳී සිටීමේ බලපත්‍රය ........................................9

(3)　仮滞在期間及び同期間の延長 ........................................9

(3)　තාවකාලික රැඳී සිටීමේ කාලසීමාව සහ එම කාලසීමාව දීර්ඝ කිරීම ........................................9

(4)　仮滞在許可の条件 ........................................10

(4)　තාවකාලික රැඳී සිටීම සඳහා කොන්දේසි ........................................10

(5)　報酬を受ける活動の許可 ........................................10

(5)　වැටුප් ලබන ක්‍රියාකාරකම් සඳහා අවසරය ........................................10

(6)　仮滞在の許可の取消し ........................................12

(6) තාවකාලික රැඳී සිටීමේ අවසරය අවලංගු කිරීම ..... 12
3 難民認定証明書等の交付 ..... 12
3 සරණාගතයකු ලෙස හඳුනාගනු ලැබීමේ සහතිකය ආදිය නිකුත් කිරීම ..... 12
4 在留資格に係る許可 ..... 12
4 පදිංචිය සඳහා අවසරය ..... 12
第 4 審査請求 ..... 13
4 වන කොටස සමාලෝචනයක් ඉල්ලා සිටීම ..... 13
1 審査請求手続 ..... 13
1 සමාලෝචනයක් ඉල්ලා සිටීමේ ක්‍රියාවලිය ..... 13
(1) 審査請求人 ..... 13
(1) සමාලෝචනයක් ඉල්ලා සිටින්නා ..... 13
(2) 審査請求ができる期間 ..... 13
(2) සමාලෝචනයක් ඉල්ලා සිටීමට හැකි කාලසීමාව ..... 13
(3) 審査請求の窓口 ..... 13
(3) සමාලෝචනයක් ඉල්ලා සිටීමේ කවුළුව ..... 13
(4) 審査請求に必要な書類 ..... 14
(4) සමාලෝචනයක් ඉල්ලා සිටීම සඳහා අවශ්‍ය ලියකියවිලි ..... 14
2 難民審査参与員 ..... 14
2 සරණාගත සමාලෝචන උපදේශකවරු ..... 14
3 法務大臣の裁決 ..... 14
3 අධිකරණ අමාත්‍යවරයාගේ තීරණය ..... 14
第 5 難民旅行証明書 ..... 16
5 වන කොටස සරණාගත සංචාරක ලේඛනය ..... 16
1 申請窓口 ..... 16
1 අයදුම් කිරීමේ කවුළුව ..... 16
2 申請に必要な書類 ..... 16
2 අයදුම් කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ..... 16
(1) 提出書類 ..... 16
(1) භාර දිය යුතු ලියකියවිලි ..... 16
(2) 提示書類 ..... 17
(2) පෙන්විය යුතු ලියකියවිලි ..... 17
3 難民旅行証明書の有効期間 ..... 17
3 සරණාගත සංචාරක ලේඛනයේ වලංගුභාවය ..... 17
4 手数料 ..... 18
4 සේවා ගාස්තු ..... 18
第 6 一時庇護のための上陸許可 ..... 19
6 වන කොටස තාවකාලික සරණාගතභාවය පතා ගොඩබැසීමේ අවසරය ..... 19

1　申請 ..... 19
1　අයදුම් කිරීම ..... 19
(1)　対象者 ..... 19
(1)　සුදුසුකම් ලත් පුද්ගලයින් ..... 19
(2)　申請方法 ..... 19
(2)　අයදුම් කරන පිළිවෙළ ..... 19
2　申請に必要な書類 ..... 19
2　අයදුම් කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ..... 19
(1)　提出書類 ..... 19
(1)　භාර දිය යුතු ලියකියවිලි ..... 19
(2)　提示書類 ..... 20
(2)　පෙන්විය යුතු ලියකියවිලි ..... 20
3　一時庇護許可書の交付 ..... 20
3　තාවකාලික සරණාගත බලපත්‍රයක් නිකුත් කිරීම ..... 20
付録　難民認定手続・補完的保護対象者認定手続図解 ..... 21
උපග්‍රන්ථය　සරණාගතයින් හඳුනාගැනීමේ ක්‍රියාවලිය සහ අනුපූරක ආරක්ෂණලාභීන් හඳුනාගැනීමේ ක්‍රියාවලිය දැක්වෙන රූප සටහන ..... 21

# 第 1　日本の難民認定制度及び補完的保護対象者認定制度の概要
# 1 වන කොටස　ජපානයේ සරණාගතයකු හඳුනාගැනීමේ ක්‍රමවේදය සහ අනුපූරක ආරක්ෂණලාභියකු හඳුනාගැනීමේ ක්‍රමවේදය පිළිබඳ දළ විශ්ලේෂණය

難民の地位に関する条約（以下「難民条約」という。）及び難民の地位に関する議定書（以下「議定書」という。）が 1982 年に我が国について発効したことに伴い、難民条約及び議定書の諸規定を国内で実施するため、難民認定制度が整備されました。この制度では、難民である外国人は、難民認定申請を行い、法務大臣から難民であるとの認定を受けることができ、また、難民条約に規定する難民としての保護を受けることができます。

1982 දී ජපානයේ සරණාගතයින්ගේ තත්ත්වය පිළිබඳ සම්මුතිය (මින් ඉදිරියට "සරණාගත සම්මුතිය" ලෙස හැඳින්වේ) සහ සරණාගතයින්ගේ තත්ත්වය පිළිබඳ ප්‍රොටෝකෝලය (මින් ඉදිරියට "ප්‍රොටෝකෝලය" ලෙස හැඳින්වේ) බලාත්මක වීමත් සමඟ, ජපානයේ සරණාගත සම්මුතියේ සහ ප්‍රොටෝකෝලයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සරණාගතයින් හඳුනාගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කරන ලදී. සරණාගතයින් වී සිටින විදේශිකයින්ට සරණාගතයින් ලෙස හඳුනාගනු ලැබීම සඳහා ඉල්ලුම් කිරීමට ද, අධිකරණ අමාත්‍යවරයා වෙතින් සරණාගතයින් ලෙස හඳුනාගැනීමට ලක් වීමට ද මෙම ක්‍රමවේදය යටතේ හැකි වන අතර, සරණාගත සම්මුතියේ නියම කර ඇති පරිදි සරණාගතයින් ලෙස රැකවරණය ලබා ගත හැකි ය.

本案内でいう「難民」とは、難民条約第 1 条又は議定書第 1 条の規定により定義される難民を意味し、それは、人種、宗教、国籍、特定の社会的集団の構成員であること又は政治的意見を理由として迫害を受けるおそれがあるという十分に理由のある恐怖を有するために国籍国の外にいる者であって、その国籍国の保護を受けることができないか又はそれを望まない者とされています。

මෙම මාර්ගෝපදේශයේ, "සරණාගතයා" යන්නෙන් අදහස් කරනු ලබන්නේ සරණාගත සම්මුතියේ 1 වන වගන්තිය හෝ ප්‍රොටෝකෝලයේ 1 වන වගන්තිය මගින් අර්ථ දක්වා ඇති ආකාරයේ සරණාගතයකු වන අතර, ජාතිය, ආගම, ජාතිකත්වය, විශේෂිත සමාජ කණ්ඩායමක සාමාජිකත්වය හෝ දේශපාලන මතය යන හේතු නිසා හිංසාපීඩාවලට ලක් වෙති යි සහේතුක බිය හේතුවෙන් ඔහුගේ හෝ ඇයගේ ජාතිකත්වය සහිත රටෙන් පිටත සිටින සහ එම රටේ ආරක්ෂාව ලබා ගැනීමට නොහැකි හෝ අකැමැති පුද්ගලයෙක් වේ.

難民認定手続とは、外国人がこの難民の地位に該当するかどうかを審査し決定する手続です。

සරණාගතයින් හඳුනාගැනීමේ ක්‍රියාවලිය යනු විදේශිකයකු මෙම සරණාගත තත්ත්වයට අයත් දැයි පරීක්ෂා කර තීරණය කිරීම සඳහා වන ක්‍රියාවලියකි.

一方で、近年、紛争避難民のように、難民条約上の難民には該当しないものの、難民と同様に保護を必要とする外国人が増加していることを受け、2023 年 12 月 1 日、補完的保護対象者認定制度が開始されました。この制度では、本邦にある外国人は、難民認定申請又は補完的保護対象者認定申請を行い、法務大臣から補完的保護対象者であるとの認定を受けることができます（難民認定申請をした外国人について、難民の認定をしない処分がされる場合に、当該外国人が補完的保護対象者に該当すると認められるときは、補完的保護対象者として認定されます。）。

අනෙක් අතට, යුදගැටුම් නිසා සරණාගත වූවන් මෙන්, සරණාගත සම්මුතිය යටතේ සරණාගතයින් බවට පත් වනු පිණිස සුදුසුකම් නොලබන, එහෙත් සරණාගතයින්ට අවශ්‍ය ආකාරයටම ආරක්ෂාව අවශ්‍ය විදේශිකයින් සංඛ්‍යාව මෑත වසරවල දී වැඩි වෙමින් පවතී. මෙයට ප්‍රතිචාර වශයෙන්, අනුපූරක ආරක්ෂණලාභීන් හඳුනාගැනීමේ ක්‍රමවේදය 2023 දෙසැම්බර් 1 වන දින දියත් කරන ලදී. මෙම ක්‍රමවේදය යටතේ, ජපානයේ සිටින විදේශිකයින්ට සරණාගතයකු ලෙස හඳුනාගනු ලැබීම පිණිස හෝ අනුපූරක ආරක්ෂණලාභියකු ලෙස හඳුනාගැනීම සඳහා ඉල්ලුම් කළ හැකි අතර අධිකරණ අමාත්‍යවරයා වෙතින් අනුපූරක ආරක්ෂණලාභියකු ලෙස හඳුනාගැනීමට ලක් විය හැකිය (සරණාගතයකු ලෙස හඳුනාගනු ලැබීම සඳහා ඉල්ලුම් කර ඇති විදේශිකයකු සරණාගතයකු

ලෙස හඳුනාගැනීමට ලක් නො වන අවස්ථාවක, ඔහු හෝ ඇය අනුපූරක ආරක්ෂණලාභියකු ලෙස සලකනු ලැබීමට සුදුසුකම් ඇතොත්, අනුපූරක ආරක්ෂණලාභියකු ලෙස හඳුනා ගනු ලැබේ).

本案内でいう「補完的保護対象者」とは、難民条約上の難民以外の者であって、難民条約上の要件のうち、「迫害を受けるおそれがある理由が、人種、宗教、国籍、特定の社会的集団の構成員であること又は政治的意見であること」以外の要件を満たす者とされています。

මෙම මාර්ගෝපදේශයෙහි “අනුපූරක ආරක්ෂණලාභියකු” ලෙස දැක්වෙන්නේ සරණාගත සම්මුතිය යටතේ සරණාගතයකු නොවන, එහෙත් “තමා හිංසාපීඩාවන්ට ලක් වීමේ අවදානමට හේතුව ජාතිය, ආගම, ජාතිකත්වය, විශේෂිත සමාජ කණ්ඩායමක සාමාජිකත්වය හෝ දේශපාලන මතය වීම” හැරෙන්නට සරණාගත සම්මුතියේ අනෙක් සියලුම කොන්දේසි සපුරන පුද්ගලයෙකි.

なお、本案内において、難民と補完的保護対象者を合わせて「難民等」といい、難民認定手続と補完的保護対象者認定手続を合わせて「難民等認定手続」といいます。

එසේම, මෙම මාර්ගෝපදේශයෙහි, සරණාගතයින් සහ අනුපූරක ආරක්ෂණලාභීන් පොදුවේ “සරණාගතයින් ආදීන්” ලෙස හඳුන්වනු ලබන අතර, සරණාගතයින් හඳුනාගැනීමේ ක්‍රියාවලිය සහ අනුපූරක ආරක්ෂණලාභීන් හඳුනාගැනීමේ ක්‍රියාවලිය පොදුවේ “සරණාගතයින් ආදීන් හඳුනාගැනීමේ ක්‍රියාවලිය” ලෙස හඳුන්වනු ලැබේ.

# 第 2　難民の認定又は補完的保護対象者の認定を受けた外国人が享受できる利益

# 2 වන කොටස　සරණාගතයින් ලෙස හෝ අනුපූරක ආරක්ෂණලාභීන් ලෙස හඳුනාගනු ලැබ ඇති විදේශිකයින්ට ලබා ගත හැකි ප්‍රතිලාභ

難民の認定又は補完的保護対象者の認定を受けた外国人は、次のような利益を受けることができます。

සරණාගතයින් ලෙස හෝ අනුපූරක ආරක්ෂණලාභීන් ලෙස හඳුනාගනු ලැබ ඇති විදේශිකයින්ට මතු දැක්වෙන ප්‍රතිලාභ භුක්ති විඳිය හැකි ය.

## 1　永住許可要件の一部緩和

## 1　ස්ථිර පදිංචිය සඳහා අවසරය ලැබීමට සැපිරිය යුතු කොන්දේසි අර්ධ වශයෙන් ලිහිල් කිරීම

日本に在留する外国人が永住許可を受けるためには、

ස්ථිර පදිංචිය සඳහා අවසරය ලබා ගැනීමට අදහස් කරන ජපානයේ ජීවත් වන විදේශිකයින්,

①　素行が善良であること

යහපත් හැසිරීමකින් යුතු වීම

②　独立の生計を営むに足りる資産又は技能を有すること

ස්වාධීන ජීවනෝපායක් පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් වත්කම් හෝ කුසලතා සතු වීම

の 2 つの要件を満たし、かつ、その者の永住が日本国の利益に合すると認められなければならないとされています。

යන අවශ්‍යතා 2 සපුරාලිය යුතු අතර, ඊට අමතරව, ඔවුන්ගේ ස්ථිර පදිංචිය ජපානයේ යහපතට හේතු වන්නක් බව හඳුනාගැනීමට ලක් විය යුතු ය.

しかし、難民の認定又は補完的保護対象者の認定を受けて在留する外国人は、このうち②の要件を満たさない場合であっても、法務大臣の裁量により永住許可を受けることができます。

එහෙත්, සරණාගතයින් ලෙස හෝ අනුපූරක ආරක්ෂණලාභීන් ලෙස හඳුනාගනු ලැබ ජපානයේ ජීවත් වන විදේශිකයින්ට, අංක ② කොන්දේසිය නොසපුරන විටදී වුව ද, අධිකරණ අමාත්‍යවරයාගේ අභිමතය පරිදි, ස්ථිර පදිංචිය සඳහා අවසරය හිමි විය හැකි ය.

## 2　難民旅行証明書の交付（難民の認定を受けた外国人に限ります。）

## 2　සරණාගත සංචාරක ලේඛනයක් නිකුත් කිරීම (සරණාගතයින් ලෙස හඳුනාගනු ලැබ ඇති විදේශිකයින් සඳහා පමණි)

難民の認定を受けた外国人が外国に旅行しようとするときは、難民旅行証明書の交付を受けることができます。難民旅行証明書を所持する外国人は、その証明書に記載されている有効期間内であれば、原則として何度でも日本から出国し、日本に再入国することができます（申請手続等については、本案内第 5 を参照。）。

සරණාගතයින් ලෙස හඳුනාගනු ලැබ ඇති විදේශිකයින් විදේශගත වීමට අදහස් කරන විට, ඔවුන් වෙත සරණාගත සංචාරක ලේඛනයක් නිකුත් කරනු ලැබිය හැකි ය. මූලික වශයෙන්, සරණාගත සංචාරක ලේඛනයක් හිමි විදේශිකයින්ට එම ලේඛනයේ දක්වා ඇති වලංගු කාලසීමාව තුළ ඕනෑම වාර ගණනක් ජපානයෙන් පිටවීමට ද නැවත ජපානයට ඇතුළුවීමට ද හැකිය (මේ සඳහා අයදුම් කිරීමේ ක්‍රියාවලිය ආදිය පිළිබඳ විස්තර සඳහා මෙම මාර්ගෝපදේශයේ 5 වන කොටස බලන්න).

なお、補完的保護対象者の認定を受けた外国人が外国に旅行しようとするときは、難民旅行証明書の交付は受けられないものの、再入国許可書の交付を受けることができます。

එසේම, අනුපූරක ආරක්ෂණය සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින් ලෙස හඳුනාගනු ලැබ ඇති විදේශිකයින් විදේශගත වන විට, ඔවුන් වෙත සරණාගත සංචාරක ලේඛනයක් නිකුත් නොකරනු ලබන නමුත් නැවත ඇතුළුවීමේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකිය.

# 第 3　難民等認定手続
# 3 කොටස　සරණාගතයින් ආදීන් හඳුනාගනු ලැබීමේ ක්‍රියාවලිය

## 1　申請手続
## 1　අයදුම් කිරීමේ ක්‍රියාවලිය

### (1)　申請期間
### (1)　අයදුම් කිරීමේ කාලසීමාව

難民等認定申請の期間について制限する規定はありません。

සරණාගතයින් ලෙස හඳුනාගනු ලැබීමට අයදුම්පත් භාර දිය යුතු කාලසීමාව පිළිබඳ සීමාකිරීම් නොමැත.

### (2)　申請窓口
### (2)　අයදුම් කිරීමේ කවුළුව

難民等認定申請は、申請者の住居地（住居地がないときは宿泊先等の所在地。以下「住居地等」といいます。）を管轄する地方出入国在留管理局、支局及び出張所で行うことができます。

අයදුම්කරුගේ පදිංචි ස්ථානය (අයදුම්කරුට පදිංචි ස්ථානයක් නොමැති නම් ඔහු නවාතැන් ගෙන සිටින ස්ථානය ආදිය, එය මෙතැන් සිට “පදිංචි ස්ථානය ආදිය” ලෙස හැඳින්වේ.) කෙරෙහි අධිකරණ බලය ඇති කලාපීය ආගමන විගමන කාර්යාංශයේදී, එහි ශාඛා කාර්යාලයේදී හෝ ප්‍රාදේශීය කාර්යාලයේදී සරණාගතයින් ලෙස හඳුනාගනු ලැබීමට අයදුම්පත් භාර දිය හැකිය.

申請は、申請者本人が自ら出頭して行ってください。ただし、申請者が 16 歳未満である場合や病気その他の理由により自ら出頭できない場合は、父母、配偶者、子又は親族がその者に代わって申請を行うことができます。

අයදුම්පත භාර දීම සඳහා අයදුම්කරු පෞද්ගලිකව පෙනී සිටිය යුතු ය. කෙසේ වෙතත්, අයදුම්කරු වයස අවුරුදු 16 ට අඩු නම් හෝ අසනීප වී සිටීම හෝ වෙනත් හේතු මත පෞද්ගලිකව පෙනී සිටීමට නොහැකි නම්, මවට හෝ පියාට, කලත්‍රයාට, දරුවෙකුට හෝ ඥාතියෙකුට ඔහු හෝ ඇය වෙනුවෙන් අයදුම් කළ හැකි ය.

地方出入国在留管理局・支局における窓口については、本案内の最終ページを参照してください。

කලාපීය ආගමන විගමන කාර්යාංශයේ සහ එහි ශාඛා කාර්යාලයේ අයදුම්පත් කවුළුව පිළිබඳ විස්තර සඳහා, කරුණාකර මෙම මාර්ගෝපදේශයේ අවසාන පිටුව බලන්න.

### (3)　申請に必要な書類
### (3)　අයදුම් කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි

申請には、次の書類が必要です。なお、怪我や身体の障害などの特段の事情があるため難民・補完的保護対象者認定申請書の記載ができない外国人は、申請書に代えて申請書に記載すべき事項を入国審査官又は難民調査官に陳述してもよいことになっています。

අයදුම් කිරීම සඳහා පහත ලේඛන අවශ්‍ය වේ. තුවාල හෝ ශාරීරික ආබාධිතභාවය වැනි විශේෂ තත්ත්ව හේතු කොට ගෙන සරණාගතයකු හෝ අනුපූරක ආරක්ෂණලාභියකු ලෙස හඳුනාගනු ලැබීමේ අයදුම්පත පිරවීමට නොහැකි විදේශිකයින්ට, තමා විසින්ම අයදුම්පත පිරවීම වෙනුවට, සිය අයදුම්පත්‍රයට ඇතුළත් කරනු ලැබිය යුතු කරුණු පිළිබඳ ප්‍රකාශයක් ආගමන පරීක්ෂකවරයා හෝ සරණාගත විමර්ශකවරයා වෙත භාර දීමට ද හැකි ය.

① 提出書類

හාර දිය යුතු ලියකියවිලි

ア 難民・補完的保護対象者認定申請書（入管庁のホームページに掲載されているほか、窓口でも配布しています。） 1通

සරණාගතයකු හෝ අනුපූරක ආරක්ෂණලාභියකු ලෙස හඳුනාගනු ලැබීමේ අයදුම්පත (මෙය ආගමන විගමන කාර්යාංශයේ වෙබ් අඩවියේ මුල්පිටුවෙහි පළ කරනු ලැබ ඇති අතර කවුළුවෙන් ද ලබා ගත හැකිය.) පිටපත් 1 ක්

※過去に難民等の認定をしない処分を受けたことがある外国人は再申請用の申請書を提出する必要がありますので、御留意ください。

※මීට පෙර සරණාගත තත්ත්වය ප්‍රතික්ෂේප වූ විදේශිකයින් නව අයදුම්පතක් භාර දීම අවශ්‍ය වන බව කරුණාවෙන් සලකන්න.

イ 申請者が難民又は補完的保護対象者であることを証明する資料（難民又は補完的保護対象者であることを主張する陳述書を含む。） 1通

අයදුම්කරු සරණාගතයකු හෝ අනුපූරක ආරක්ෂණලාභියකු වීමට සුදුසුකම් සහිත තැනැත්තකු බව සහතික කරන ලියකියවිලි (අයදුම්කරු සරණාගතයකු හෝ අනුපූරක ආරක්ෂණලාභියකු වීමට සුදුසුකම් සහිත තැනැත්තකු බව ප්‍රකාශ කරන ප්‍රකාශයක් ඇතුළුව) පිටපත් 1 ක්

ウ 写真（以下の要件を満たし、裏面に氏名が記載されているもの。） 1葉

ඡායාරූපයක් (පහත අවශ්‍යතා සපුරාලන සහ අයදුම්කරුගේ නම එහි පිටුපස ලියන ලද) පිටපත් 1ක්

（ただし、在留資格未取得外国人については、2葉）

(එහෙත්, පදිංචිය පිළිබඳ තත්ත්වයක් නොමැති විදේශිකයින් සඳහා, පිටපත් 2 ක්)

【要件】

[අවශ්‍යතා]

(ア) 申請者本人のみが撮影されたものであること

ඡායාරූපය අයදුම්කරු පමණක් පෙනී සිටින්නක් වීම

(イ) 写真の寸法

ඡායාරූපයේ මිනුම්

縁を除いた部分の寸法が、下記の寸法を満たしたものであること（顔の寸法は、頭頂部（髪を含む。）からあご先まで）

ඡායාරූපයේ මිනුම් එය වටා ඇති තීරය හැර පහත මිනුම්වලට අනුකූල විය යුතු ය. (මුහුණේ මිනුම (කොණ්ඩය ඇතුළුව) හිසෙහි ඉහළ සිට නිකට කෙළවර දක්වා වේ.)



(ウ) 無帽で正面を向いたものであること(宗教上又は医療上の理由により本要件を満たす写真を提出することができない特段の事情がある場合、当該事情に係る陳述書（任意様式）を提出してください。)

ඡායාරූපය හිස්වැසුමක් රහිතව ඉදිරියට මුහුණ ලා ගන්නා ලද එකක් විය යුතුය (ආගමික හෝ වෛද්‍ය හේතු මත මෙම අවශ්‍යතා සපුරාලන ඡායාරූපයක් ඉදිරිපත් කිරීමට ඔබට අපහසු වන විශේෂ තත්ත්ව පවතින්නේ නම්, කරුණාකර එම තත්ත්ව සම්බන්ධයෙන් ප්‍රකාශයක් (තමන් කැමති ආකෘතියකින්) ඉදිරිපත් කරන්න.)

(エ) 背景（影を含む。）がないものであること

ඡායාරූපයේ පසුබිමෙහි කිසිවක් (සෙවනැලි ද ඇතුළුව) නොතිබිය යුතුය.

(オ) 鮮明であること（写真の焦点が合っているもの、しみ、汚れ、穴等がなく、顔写真に影がないもの、衣服や頭髪等により目、鼻、口等が隠れていないもの、背景がないもの等。出入国在留管理庁ホームページに掲載している申請用写真の見本・事例集を参照してください。)

ඡායාරූපය පැහැදිලි විය යුතුය (ඡායාරූපය නාභිගත වී තිබිය යුතුය, ඡායාරූපය කිලිටි වී එහි ලප, පැල්ලම්, සිදුරු ආදිය නොතිබිය යුතුය, ඡායාරූපයේ දැක්වෙන මුහුණේ සෙවනැලි නොතිබිය යුතු අතර දෑස්, නාසය, මුඛය ආදිය ඇඳුම්වලින් හෝ හිසකෙස්වලින් වැසී නොතිබිය යුතුය, ඡායාරූපයේ පසුබිමේ කිසිවක් නොතිබිය යුතුය. කරුණාකර ආගමන විගමන සේවා නියෝජිත ආයතනයේ වෙබ් අඩවියේ මුල්පිටුවෙහි පළ කරනු ලැබ ඇති අයදුම්පත් ඡායාරූපවල නිදර්ශන සහ සිද්ධි අධ්‍යයන පිරික්සා බලන්න.)

(カ) 提出の日前 6 か月以内に撮影されたものであること（入院中のため写真を撮影することができないなど、6 か月以内に撮影した写真を提出できないことについてやむを得ない理由がある場合には、可能な限り新しい写真を提出してください。)

ඡායාරූපය එය ඉදිරිපත් කරනු ලබන දිනට පෙර මාස හයක් ඇතුළත ලබාගෙන තිබිය යුතුය (මාස හයක් ඇතුළත ගන්නා ලද ඡායාරූපයක් ඉදිරිපත් කිරීමට නොහැකි වන්නා වූ, රෝහල්ගත වීම හේතුවෙන් ඡායාරූපයක් ගැනීමට නොහැකි වීම වැනි, නොවැළැක්විය හැකි වූ හේතුවක් ඔබට තිබේ නම්, හැකි අවස්ථාවක වඩාත් මෑතකාලීන ඡායාරූපයක් ඉදිරිපත් කරන්න.)

エ 旅券又は在留資格証明書を提示できない者にあっては、その理由を記載した書類 1 通

ඔබට ඔබගේ විදේශ ගමන් බලපත්‍රය හෝ පදිංචිය පිළිබඳ තත්ත්වය සනාථ කරන සහතිකය ඉදිරිපත් කළ නොහැකි නම්, ඊට හේතුව සඳහන් සඳහන් කරන ප්‍රකාශයක් පිටපත් 1 ක්

② 提示書類

පෙන්විය යුතු ලියකියවිලි

ア 中長期在留者にあっては、旅券及び在留カード

මධ්‍ය-දීර්ඝකාලීන පදිංචිකරුවන් සඳහා, විදේශ ගමන් බලපත්‍රය සහ නේවාසික කාඩ්පත

イ 特別永住者にあっては、旅券及び特別永住者証明書

විශේෂ ස්ථිර පදිංචිකරුවන් සඳහා, විදේශ ගමන් බලපත්‍රය සහ විශේෂ ස්ථිර පදිංචි සහතිකය

ウ 中長期在留者及び特別永住者以外の者にあっては、旅券又は在留資格証明書

මධ්‍ය-දීර්ඝකාලීන පදිංචිකරුවන් සහ විශේෂ ස්ථිර පදිංචිකරුවන් හැර වෙනත් අය සඳහා, විදේශ ගමන් බලපත්‍රය හෝ පදිංචිය පිළිබඳ තත්ත්වය සනාථ කරන සහතිකය

（監理措置中の者にあっては、監理措置決定通知書)

(අධීක්ෂණය යටතේ සිටින අය සඳහා, අධීක්ෂණ තීරණය හෙළි කරන ප්‍රකාශය)

（仮放免中の者にあっては、仮放免許可書）

(තාවකාලික නිදහස් කිරීම මත සිටින අය සඳහා, තාවකාලිකව නිදහස් කරනු ලැබීමේ බලපත්‍රය)

エ　仮上陸の許可、船舶観光上陸の許可、乗員上陸の許可、緊急上陸の許可、遭難による上陸の許可又は一時庇護のための上陸の許可を受けている者にあっては、当該許可書

තාවකාලික ගොඩබෑසීම සඳහා අවසරය, නැව් මගින් එන සංචාරකයින් උදෙසා ගොඩබෑසීම සඳහා අවසරය, කාර්යමණ්ඩල සාමාජිකයින් උදෙසා ගොඩබෑසීම සඳහා අවසරය, හදිසි ගොඩබෑසීමක් සඳහා අවසරය, ආපදාවක් හේතුවෙන් ගොඩබෑසීම සඳහා අවසරය හෝ තාවකාලික සරණාගතභාවය උදෙසා ගොඩබෑසීම සඳහා අවසරය ලබා ඇති පුද්ගලයින්, තමාට අදාළ ඒ ඒ අවසරපත්‍රය

(4) 難民又は補完的保護対象者であることの立証

(4) සරණාගත තත්ත්වය පිළිබඳ හෝ අනුපූරක ආරක්ෂණය ලැබීමට සුදුසු බවට තහවුරුව

難民等の認定は、申請者から提出された資料や申請者の供述等に基づいて行われます。したがって、申請者は、難民等であることについて自ら立証することが求められます。なお、資料（陳述書を含む。）が外国語で作成されているときは、その資料の訳文を添付してください。

සරණාගතයින් ආදීන්ගේ හඳුනාගැනීම තීරණය කරනු ලබන්නේ අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද ලේඛන සහ අයදුම්කරුගේ ප්‍රකාශ මත ය. එබැවින්, අයදුම්කරුවන් තමන් සරණාගතයින් ආදීන් බව සනාථ කිරීමට අවශ්‍ය වේ. සිය ලේඛන (ප්‍රකාශය ඇතුළුව) විදේශීය භාෂාවකින් ලියනු ලැබ තිබේ නම්, කරුණාකර ඒ ලේඛනවල පරිවර්තන අමුණන්න.

申請者の提出した資料のみでは十分な立証が得られない場合には、難民調査官が公務所等に照会するなどして、申請者の申し立てる事実の有無について調査し、難民等の認定が適正に行われるように努めます。

අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද ලේඛන සිද්ධිය සනාථ කිරීමට ප්‍රමාණවත් නොවේ නම්, සරණාගත විමර්ශකවරයා රාජ්‍ය කාර්යාලවලින් සහ අනෙකුත් ආයතනවලින් විමසා, අයදුම්කරු විසින් ප්‍රකාශ කරන ලද කරුණු සත්‍ය දැ යි විමර්ශනය කර, අයදුම්කරුගේ සරණාගත තත්ත්වය නිසි ලෙස හඳුනාගනු ලබන බව සහතික කිරීමට උත්සාහ කරනු ඇත.

## 2　仮滞在の許可

## 2　තාවකාලික රැඳී සිටීමේ අවසරය

不法滞在者等の在留資格未取得外国人から難民等認定申請があったときは、その者の法的地位の安定を図るため、当該外国人が本邦に上陸した日（本邦にある間に難民等となる事由が生じた者にあっては、その事実を知った日）から 6 か月以内に難民等認定申請を行ったものであること、迫害を受けるおそれのあった領域から直接本邦に入ったものであることなどの一定の要件を満たす場合には、仮に本邦に滞在することを許可し、その間は退去強制手続が停止されます。

නීතිවිරෝධී පදිංචිකරුවෙකු හෝ පදිංචිය පිළිබඳ තත්ත්වයක් නොමැති වෙනත් විදේශීය ජාතිකයෙකු විසින් සරණාගත තත්ත්වය ලබා ගැනීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කරන ලද විට, එම පුද්ගලයාගේ නීත්‍යානුකූල තත්ත්වය ස්ථාවර කිරීම සඳහා, ඔහු ජපානයට ගොඩබසින දින සිට (නැතහොත්, ජපානයේ සිටියදී සරණාගතයකු බවට පත් වූ පුද්ගලයෙකු සම්බන්ධයෙන් ගත් කල, ඔහු එම කරුණ දැන ගත් දින සිට) මාස හයක් ඇතුළත සරණාගත තත්ත්වය ලබා ගැනීම සඳහා අයදුම්පත ඉදිරිපත් කර ඇති බව සහ එකී විදේශීය ජාතිකයා ඔහු හෝ ඇය පීඩාවට පත්වීමේ අවදානමක් ඇති භූමියක සිට ඍජුවම ජපානයට ඇතුළු වී ඇති බව වැනි යම් යම් කොන්දේසි සපුරාලන්නේ නම්, ජපානයේ රැඳී සිටීම පිණිස සරණාගත තත්ත්වය තාවකාලිකව ලබා දෙනු ලබන අතර, එම කාලය තුළ පිටුවහල් කිරීමේ ක්‍රියාවලිය අත්හිටුවනු ඇත.

なお、仮滞在許可の判断は、難民等認定申請者から提出のあった難民・補完的保護対象者認定申請書等の書類により行いますので、別途、仮滞在許可のための申請は必要ありません。

එසේම, තාවකාලිකව රැඳී සිටීම සඳහා අවසර ලබා දෙනු ලබන්නේ ද යන තීරණය, සරණාගතයින් ආදීන් ලෙස හඳුනාගනු ලැබීමට පතන අයදුම්කරුවන් භාර දෙන සරණාගත හෝ අනුපූරක ආරක්ෂණලාභී තත්ත්වය සඳහා වන අයදුම්පත්‍රය වැනි ලේඛන මත පදනම් වෙමින් ගනු ලබන බැවින්, තාවකාලිකව රැඳී සිටීමට අවසරය පතා වෙනම අයදුම් කිරීමට අවශ්‍ය නොවේ.

(1) 仮滞在許可による滞在

(1) තාවකාලික රැඳී සිටීමේ අවසරය මත රැඳී සිටීම

仮滞在許可を受けると一時的に退去強制手続が停止され、仮滞在期間の経過等により当該許可が終了するまでの間は、適法に本邦に滞在することができます。

තාවකාලික රැඳී සිටීමේ අවසරය ලබා දෙන ලද විට, පිටුවහල් කිරීමේ ක්‍රියාවලිය තාවකාලිකව අත්හිටුවනු ලබන අතර, එම පුද්ගලයාට සිය තාවකාලික රැඳී සිටීමේ කාලය අවසන් වන තෙක් ජපානයේ නීත්‍යානුකූලව රැඳී සිටිය හැකිය.

(2) 仮滞在許可書

(2) තාවකාලික රැඳී සිටීමේ බලපත්‍රය

法務大臣が仮滞在の許可をした外国人には、仮滞在許可書が交付されます。

අධිකරණ අමාත්‍යවරයා විසින් තාවකාලික රැඳී සිටීමේ අවසරය ලබා දෙනු ලැබ ඇති විදේශිකයින්ට තාවකාලික රැඳී සිටීමේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

許可を受けている間は、この許可書を常に携帯する必要があります。

අවසරය ලබා සිටින කාලසීමාව අතරතුරේදී, සැම විටම ඔවුන් මෙම බලපත්‍රය තමන් සමීපයේ තබා ගැනීම අවශ්‍ය ය.

(3) 仮滞在期間及び同期間の延長

(3) තාවකාලික රැඳී සිටීමේ කාලසීමාව සහ එම කාලසීමාව දීර්ඝ කිරීම

仮滞在期間は、原則として 6 月です。

තාවකාලික රැඳී සිටීමේ කාලය, මූලික වශයෙන් මාස 6 කි.

仮滞在期間の更新申請は、許可期限の 10 日前から、申請者の住居地等を管轄する地方出入国在留管理局、支局及び出張所で受け付けています。また、申請書は、入管庁のホームページに掲載されているほか、各地方出入国在留管理局、支局及び出張所の窓口で配布しています。

තාවකාලික රැඳී සිටීමේ කාලසීමාව අලුත් කිරීම සඳහා වන අයදුම්පත්, බලපත්‍රයේ කල් ඉකුත් වීමේ දිනයට දින 10 කට පෙර සිට, අයදුම්කරුගේ පදිංචි ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති කලාපීය ආගමන විගමන කාර්යාංශයේ, එහි ශාඛා කාර්යාලයේ හෝ ප්‍රාදේශීය කාර්යාලයේ දී භාර ගනු ලැබේ. ඊට අමතරව, අදාළ අයදුම්පත් ආගමන විගමන කාර්යාංශයේ වෙබ් අඩවියේ මුල්පිටුවෙහි පළ කරනු ලැබ ඇති අතර කලාපීය ආගමන විගමන කාර්යාංශවල, එහි ශාඛා කාර්යාලවල සහ ප්‍රාදේශීය කාර්යාලවල ඇති කවුන්ටරවලින් ද නිකුත් කරනු ලැබේ.

地方出入国在留管理局・支局における窓口については、本案内の最終ページを参照してください。

කලාපීය ආගමන විගමන කාර්යාංශවල සහ ශාඛා කාර්යාලවල ඇති කවුළු පිළිබඳ තොරතුරු සඳහා, කරුණාකර මෙම මාර්ගෝපදේශයේ අවසාන පිටුව බලන්න.

(4) 仮滞在許可の条件

(4) තාවකාලික රැඳී සිටීම සඳහා කොන්දේසි

仮滞在許可を受けた者は、住居や行動範囲が制限されるほか、難民調査官から出頭の要請があった場合には、指定された日時、場所に出頭して、難民等認定手続へ協力する義務が課されるなど、種々の条件が付されます。

තාවකාලික රැඳී සිටීමේ අවසරය ලබා ඇති අය, ඔවුන්ගේ පදිංචියේ සහ සංචලන ප්‍රදේශයේ සීමා කිරීම්වලට යටත් වීම, සරණාගත විමර්ශකවරයෙකු විසින් ඉල්ලා සිටිනු ලබන නිශ්චිත දිනයක දී, වේලාවක දී සහ ස්ථානයක දී පෙනී සිටීමට සහ සරණාගත තත්ත්වය තීරණය කිරීමේ ක්‍රියාවලිය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට බැඳී සිටීම වැනි විවිධ කොන්දේසිවලට යටත් වේ.

(5) 報酬を受ける活動の許可

(5) වැටුප් ලබන ක්‍රියාකාරකම් සඳහා අවසරය

仮滞在の許可を受けた者が生計を維持するために必要な範囲で行う報酬を受ける活動について、相当と認められるときには許可される場合があります。

සුදුසු යැයි සලකනු ලබන අවස්ථාවල දී, තාවකාලික රැඳී සිටීමේ අවසරය ලබා ඇති අයට ඔවුන්ගේ ජීවිකාව පවත්වා ගැනීම සඳහා වේතනයක් ලබන ක්‍රියාකාරකම්වල යෙදීමට අවසර දෙනු ලැබීමට ඉඩ ඇත.

① 申請期間

අයදුම් කිරීමේ කාලසීමාව

仮滞在許可を受けた日から当該許可の満了日までの間

තාවකාලික රැඳී සිටීමේ අවසරය ලබා දෙන ලද දිනයේ සිට එම අවසරය කල්ඉකුත් වන දිනය දක්වා කාලසීමාව

② 申請窓口

අයදුම්පත් කවුළුව

申請者の住居地等を管轄する地方出入国在留管理局、支局及び出張所で行うことができます。

අයදුම්කරුගේ පදිංචි ස්ථානය ආදිය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති කලාපීය ආගමන විගමන කාර්යාංශයේ දී, එහි ශාඛා කාර්යාලයේ දී හෝ ප්‍රාදේශීය කාර්යාලයේ දී අයදුම්පත් භාර දෙනු ලැබිය හැකිය.

③ 申請に必要な書類

අයදුම්පත සඳහා අවශ්‍ය ලියකියවිලි

ア 報酬を受ける活動許可申請書（入管庁のホームページに掲載されているほか、窓口でも配布しています。） 1通

වැටුප් ලබන ක්‍රියාකාරකම්වල නියැලීමට අවසර ඉල්ලා සිටින අයදුම්පත (මෙය ආගමන කාර්යාංශයේ වෙබ් අඩවියේ මුල්පිටුවෙහි පළ කරනු ලැබ ඇති අතර කාර්යාලයේ කවුළුවෙන් ද ලබා ගත හැකිය.) පිටපත් 1 ක්

イ 労働基準法第 15 条第 1 項及び同法施行規則第 5 条に基づき、労働者に交付される労働条件を明示する文書

කම්කරු ප්‍රමිති පනතේ 15 වන වගන්තිය, 1 වන ඡේදය සහ එම පනත බලාත්මක කිරීමේ රෙගුලාසිවල 5 වන වගන්තිය මත පදනම්ව සේවකයින්ට නිකුත් කරන ලද සේවා කොන්දේසි පැහැදිලිව සඳහන් කරන ලියකියවිලි

ウ　就業予定機関について、本邦内に本店又は事業所等があることを疎明する資料（パンフレット、登記事項証明書など）

රැකියාවේ යෙදීමට අපේක්ෂිත ආයතනය සතුව ජපානය තුළ ප්‍රධාන කාර්යාලයක් හෝ ව්‍යාපාරික කාර්යාලයක් ආදිය ඇති බව සනාථ කරන ලියකියවිලි (අත්පත්‍රිකා, ලියාපදිංචි සහතිකය ආදිය)

エ　就業予定機関の直近 3 ヶ月分の給与所得・退職所得等の所得税徴収高計算書の写し

රැකියාවේ යෙදීමට අපේක්ෂිත ආයතනයේ පසුගිය මාස තුන සඳහා වැටුප් ආදායම, විශ්‍රාම ආදායම ආදිය සඳහා ආදායම් බදු ප්‍රකාශයේ පිටපත්

オ　申請者の収入又は資産を疎明する資料

අයදුම්කරුගේ ආදායම හෝ වත්කම් සනාථ කරන ලියකියවිලි

カ　同居者等の収入又は資産を疎明する資料（申請者と生計を一にする同居者等がいる場合）

එකට ජීවත් වන සාමාජිකයන් ආදීන්ගේ ආදායම හෝ වත්කම් සනාථ කරන ලියකියවිලි (එකම නිවසක් බෙදා ගනිමින් එකට ජීවත් වන සාමාජිකයන් ආදීන් අයදුම්කරුට සිටී නම්)

キ　住居の賃貸借契約書の写し（賃貸借契約を締結している場合）

කුලී නිවසේ කොන්ත්‍රාත්තු ලේඛනයේ පිටපතක් (කුලී ගෙවන නිවාස කොන්ත්‍රාත්තුවකට බැඳී ඇත්නම්)

ク　各種団体や個人からの金銭援助を受けていること及び援助の内容を疎明する資料（各種団体や個人からの金銭援助を受けている場合）

විවිධ සංවිධානවලින් හෝ පුද්ගලයින්ගෙන් ලැබෙන මූල්‍ය ආධාර සනාථ කරන ලියකියවිලි සහ එවන් ආධාරවල විස්තර (විවිධ සංවිධානවලින් හෝ පුද්ගලයින්ගෙන් මූල්‍ය ආධාර ලබා ගෙන ඇත්නම්)

ケ　写真（写真の規格については、前記 1(3)の写真の要件を参照してください。）

ඡායාරූපයක් (ඡායාරූපයේ ප්‍රමිතීන් සඳහා, ඉහත 1 (3) හි ඡායාරූපය පිළිබඳ කොන්දේසි කියවා බලන්න.)

④　報酬を受ける活動の状況に関する届出

වැටුප් ලබන ක්‍රියාකාරකම්වල තත්ත්වය පිළිබඳ දැනුම්දීම

報酬を受ける活動の許可を受けた者は、報酬を受ける活動の許可を受けた日又は直近の届出の日から 6 月を超えない範囲で、住居地等を管轄する地方出入国在留管理局、支局及び出張所に出頭し、「報酬を受ける活動の状況に関する届出書」（入管庁ホームページに掲載されているほか、窓口でも配布しています。）を提出しなければなりません。

වැටුප් ලබන ක්‍රියාකාරකම්වල යෙදීමට අවසර ලබා ඇති අය, වැටුප් ලබන ක්‍රියාකාරකම්වල යෙදීමට අවසර ලැබූ දින සිට හෝ වඩාත්ම මෑතකාලීන දැනුම්දීමේ දිනයේ සිට මාස 6 ක් ඇතුළත, ඔවුන්ගේ පදිංචි ස්ථානය ආදිය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති කලාපීය ආගමන විගමන කාර්යාංශයේ, එහි ශාඛා කාර්යාලයේ හෝ ප්‍රාදේශීය කාර්යාලයේ පෙනී සිටිය යුතු අතර, “වැටුප් ලබන ක්‍රියාකාරකම්වල තත්ත්වය පිළිබඳ දැනුම්දීමේ ලේඛනය” (මෙය ආගමන කාර්යාංශයේ වෙබ් අඩවියේ මුල්පිටුවෙහි පළ කරනු ලැබ ඇති අතර කවුළුවෙන් ද ලබා ගත හැකිය) භාර දීම අත්‍යවශ්‍ය වේ.

### (6) 仮滞在の許可の取消し

### (6) තාවකාලික රැඳී සිටීමේ අවසරය අවලංගු කිරීම

仮滞在の許可を受けた者がその付された条件に違反した場合、許可なく報酬を受ける活動を行った場合、不正に難民等認定を受ける目的で偽変造された資料を提出した場合、虚偽の陳述をした場合等には仮滞在の許可が取り消されることがあります。

තාවකාලික රැඳී සිටීමේ අවසරය ලබා ඇති පුද්ගලයෙකු ඒ හා සබැඳි කොන්දේසි උල්ලංඝනය කරන්නේ නම්, අවසරයකින් තොරව වැටුප් ලබන ක්‍රියාකාරකම්වල නියැලෙන්නේ නම්, වංචනික ලෙස සරණාගත තත්ත්වය ලබා ගැනීමේ අරමුණින් ව්‍යාජ හෝ වෙනස් කරන ලද ලියකියවිලි ඉදිරිපත් කරන්නේ නම් හෝ ව්‍යාජ ප්‍රකාශයක් සිදු කරන්නේ නම් තාවකාලික රැඳී සිටීමේ අවසරය අවලංගු විය හැකිය.

## 3 難民認定証明書等の交付

## 3 සරණාගතයකු ලෙස හඳුනාගනු ලැබීමේ සහතිකය ආදිය නිකුත් කිරීම

法務大臣が難民であると認定した外国人には、難民認定証明書が交付され、補完的保護対象者であると認定した外国人には、補完的保護対象者認定証明書が交付されます。

අධිකරණ අමාත්‍යවරයා විසින් සරණාගතයකු ලෙස හඳුනාගනු ලබන විදේශිකයකු වෙත සරණාගතයකු ලෙස හඳුනාගනු ලැබීමේ සහතිකය නිකුත් කරනු ලබන අතර, අනුපූරක ආරක්ෂණලාභියකු ලෙස හඳුනාගනු ලබන විදේශිකයකු වෙත අනුපූරක ආරක්ෂණලාභියකු ලෙස හඳුනාගනු ලැබීමේ සහතිකය නිකුත් කරනු ලැබේ.

難民認定申請を行った者が難民として認定されなかった場合でも、補完的保護対象者として認定された場合には、補完的保護対象者認定証明書が交付されます。

සරණාගතභාවය සඳහා අයදුම් කළ පුද්ගලයකු සරණාගතයකු ලෙස හඳුනාගනු නොලැබුව ද, ඔහු හෝ ඇය අනුපූරක ආරක්ෂණලාභියකු ලෙස හඳුනාගනු ලැබුවහොත්, අනුපූරක ආරක්ෂණලාභියකු ලෙස හඳුනාගනු ලැබීමේ සහතිකය නිකුත් කරනු ලැබේ.

難民等としての各種の保護措置を受ける際に、難民等であることの証明を求められた場合には、これらの証明書を提示してください。

සරණාගතයකු ආදියකු වශයෙන් විවිධ රැකවරණ පියවර සඳහා අයදුම් කිරීමේදී, ඔබ සරණාගතයකු ආදියකු බව ඔප්පු කිරීමට ඔබෙන් ඉල්ලා සිටිනු ලැබුවහොත්, කරුණාකර මෙම සහතිකය ඉදිරිපත් කරන්න.

## 4 在留資格に係る許可

## 4 පදිංචිය සඳහා අවසරය

難民等として認定された外国人が在留資格未取得外国人であるときは、一定の退去強制事由に該当せず、かつ、一定の刑罰法令違反により懲役等に処されたことがないときなど、一定の要件を満たした場合には、定住者の在留資格が一律に付与されます。

සරණාගතයකු ආදියකු ලෙස හඳුනාගන්නා ලද විදේශිකයකු පදිංචිය පිළිබඳ තත්ත්වයක් ලබා ගෙන නොමැති නම්, බලහත්කාරයෙන් පිටුවහල් කිරීම සඳහා හේතු වන යම් යම් කාරණාවලට යටත් නොවන්නේ නම් සහ ඇතැම් අපරාධ නීති ආදිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කිසිවිටෙකත් සිරදඬුවමකට යටත් කරනු ලැබ නොමැති නම්, ඔහුට හෝ ඇයට දිගුකාලීන පදිංචිය පිළිබඳ තත්ත්වය සමාන ආකාරයෙන් ලබා දෙනු ලැබේ.

これにより、3 月を超える在留期間となった外国人には在留カードが交付されます。

ඊට අනුකූලව, රැඳී සිටීමේ කාලය මාස 3 කට වඩා වැඩි වන විදේශිකයින්ට නේවාසික කාඩ්පතක් නිකුත් කරනු ලැබේ.

# 第4　審査請求
# 4 වන කොටස　සමාලෝචනයක් ඉල්ලා සිටීම

## 1　審査請求手続
## 1　සමාලෝචනයක් ඉල්ලා සිටීමේ ක්‍රියාවලිය

### (1)　審査請求人
### (1)　සමාලෝචනයක් ඉල්ලා සිටින්නා

難民等認定申請をしたものの認定されなかった外国人や難民等の認定を取り消された外国人は、法務大臣に対し、審査請求をすることができます。

සරණාගතයකු ආදියකු ලෙස හඳුනාගනු ලැබීමට ඉල්ලුම් කළ නමුත් එසේ හඳුනාගැනීමට ලක් නොවූ හෝ සරණාගතයකු ආදියකු ලෙස හඳුනාගනු ලැබීම අවලංගු වී ඇති විදේශිකයින්ට අධිකරණ අමාත්‍යවරයාගෙන් සමාලෝචනයක් ඉල්ලා සිටිය හැකිය.

### (2)　審査請求ができる期間
### (2)　සමාලෝචනයක් ඉල්ලා සිටීමට හැකි කාලසීමාව

審査請求期間は、難民等の認定をしない旨の通知又は難民等の認定を取り消した旨の通知を受けた日から 7 日以内となっています。ただし、天災その他やむを得ない理由があるときは、7 日経過後であっても審査請求をすることができます。

සමාලෝචනයක් ඉල්ලා සිටීමට හැකි කාලසීමාව වන්නේ සරණාගතයකු ආදියකු ලෙස හඳුනා නොගැනුණු බවට හෝ සරණාගතයකු ආදියකු ලෙස හඳුනාගනු ලැබීම අවලංගු කරන ලද බවට දැන්වීමක් ලැබුණු දිනයේ සිට දින 7 ක් ඇතුළත වේ. එසේ වෙතත්, ස්වාභාවික විපතක් හෝ වෙනත් නොවැළැක්විය හැකි හේතුවක් ඇති අවස්ථාවක, දින 7 ක් ගත වූ පසුව වුවද සමාලෝචනයක් ඉල්ලීම සිදු කරනු ලැබිය හැකිය.

### (3)　審査請求の窓口
### (3)　සමාලෝචනයක් ඉල්ලා සිටීමේ කවුළුව

審査請求は、難民等認定申請の場合と同様、審査請求人の住居地等を管轄する地方出入国在留管理局、支局及び出張所で行うことができます。

සරණාගතයකු ආදියකු ලෙස හඳුනාගනු ලැබීම සඳහා අයදුම් කිරීමේ දී හා සමානවම, සමාලෝචනයක් ඉල්ලා සිටින්නාගේ පදිංචි ස්ථානය ආදිය කෙරෙහි අධිකරණ බලය ඇති කලාපීය ආගමන විගමන කාර්යාංශයේදී, එහි ශාඛා කාර්යාලයේදී හෝ ප්‍රාදේශීය කාර්යාලයේදී සමාලෝචනයක් ඉල්ලීම සිදු කරනු ලැබිය හැකිය.

なお、代理人による審査請求が認められるほか、必要書類を郵送して審査請求をすることもできます。地方出入国在留管理局・支局における審査請求窓口については、本案内の最終ページを参照してください。

එසේම, තමාගේ නියෝජිතයකු හරහා සමාලෝචන ඉල්ලීමක් සිදු කිරීමට අවසර ඇති අතර, අවශ්‍ය ලියකියවිලි තැපැලෙන් යැවීමෙන් ද සමාලෝචනයක් ඉල්ලීම සිදු කරනු ලැබිය හැකිය. කලාපීය ආගමන විගමන කාර්යාංශවල දී සහ ශාඛා කාර්යාලවල දී සමාලෝචන ඉල්ලීම් භාර දීම පිණිස ඇති කවුළු පිළිබඳ තොරතුරු සඳහා, කරුණාකර මෙම මාර්ගෝපදේශයේ අවසාන පිටුව බලන්න.

(4) 審査請求に必要な書類

(4) සමාලෝචනයක් ඉල්ලා සිටීම සඳහා අවශ්‍ය ලියකියවිලි

次の書類を提出してください。

කරුණාකර මතු දැක්වෙන ලේඛන ඉදිරිපත් කරන්න.

① 審査請求書（窓口に備え付けてあります。） 1通

සමාලෝචනයක් ඉල්ලා සිටීමේ අයදුම්පත (කවුළුවෙන් ලබා ගත හැකි ය.) පිටපත් 1 ක්

② 審査請求の理由を立証する資料（陳述書でも差し支えありません。） 1通

සමාලෝචනයක් ඉල්ලා සිටීමට හේතු සනාථ කරන ලියකියවිලි (ලිඛිත ප්‍රකාශයක් වුව ද ගැටලුවක් නැත.) පිටපත් 1 ක්

2 難民審査参与員

2 සරණාගත සමාලෝචන උපදේශකවරු

難民審査参与員は、人格が高潔であって、審査請求に関し公正な判断をすることができ、かつ、法律又は国際情勢に関する学識経験を有する者のうちから任命されています。また、難民審査参与員を「審理員」とみなして行政不服審査法が適用され、難民審査参与員は審理を主宰し法務大臣に意見を述べることとなっています。なお、法務大臣は、審査請求の裁決に当たっては、難民審査参与員の意見を聴かなければならないこととされています。

සරණාගත සමාලෝචන උපදේශකවරු පත් කරනු ලබන්නේ ඉහළ සදාචාරාත්මක චරිතයක් ඇති, සමාලෝචන ඉල්ලීම් සම්බන්ධයෙන් සාධාරණ විනිශ්චයන් කළ හැකි සහ නීතිය හෝ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ අධ්‍යයන අත්දැකීම් ඇති පුද්ගලයන් අතරින් තෝරා ගැනීමෙනි. ඊට අමතරව, සරණාගත සමාලෝචන උපදේශකවරුන් “විනිසුරුවරුන්” ලෙස සලකා පරිපාලන අභියාචනා පනත ඔවුන්ට අදාළ වන අතර, එකී සරණාගත සමාලෝචන උපදේශකවරුන් පරීක්ෂණ මෙහෙයවා අධිකරණ අමාත්‍යවරයාට තම අදහස දැන්විය කළ යුතුය. ඊට අමතරව, සමාලෝචන ඉල්ලීමක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීමේදී අධිකරණ අමාත්‍යවරයා සරණාගත සමාලෝචන උපදේශකවරුන්ගේ අදහස්වලට සවන් දීම අනිවාර්ය කරනු ලැබ තිබේ.

3 法務大臣の裁決

3 අධිකරණ අමාත්‍යවරයාගේ තීරණය

法務大臣が、審査請求には理由がある旨の裁決をし、難民又は補完的保護対象者と認定された外国人には、それぞれ難民認定証明書又は補完的保護対象者認定証明書が交付されます。

සමාලෝචන ඉල්ලීම යුක්තිසහගත බවට අධිකරණ අමාත්‍යවරයා තීරණයක් ගත් විට, සරණාගතයකු ලෙස හඳුනාගනු ලැබෙන හෝ අනුපූරක ආරක්ෂණලාභියකු ලෙස හඳුනාගනු ලැබෙන විදේශිකයකුට, පිළිවෙලින්, සරණාගතයකු ලෙස හඳුනාගනු ලැබීමේ සහතිකය හෝ අනුපූරක ආරක්ෂණලාභියකු ලෙස හඳුනාගනු ලැබීමේ සහතිකය නිකුත් කරනු ලැබේ.

難民等として認められた外国人が在留資格未取得外国人であるときは、一定の退去強制事由に該当せず、かつ、一定の刑罰法令違反により懲役等に処されたことがないときなど、一定の要件を満たした場合には、定住者の在留資格が付与されます。

සරණාගතයකු හෝ පදිංචිය පිළිබඳ වෙනත් තත්ත්වයක් සහිත තැනැත්තකු ලෙස හඳුනාගනු ලැබ ඇති විදේශිකයකුට තවමත් පදිංචිය පිළිබඳ තත්ත්වයක් නොමැති නම්, පිටුවහල් කිරීම සඳහා හේතු වන යම් යම් කාරණාවන්ට යටත් නොවන්නේ නම් සහ ඇතැම් අපරාධ නීති ආදිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කිසිවිටෙකත් සිරදඬුවමකට යටත් කරනු ලැබ නොතිබීම ආදී යම් යම් කොන්දේසි සපුරන්නේ නම්, ඔහුට හෝ ඇයට දිගුකාලීන පදිංචිකරුවෙකුගේ පදිංචිය පිළිබඳ තත්ත්වය ලබා දෙනු ලැබේ.

これにより、3 月を超える在留期間となった外国人には在留カードが交付されます。

ඊට අනුකූලව, රැඳී සිටීමේ කාලය මාස තුනකට වඩා වැඩි වන විදේශිකයින්ට නේවාසික කාඩ්පතක් නිකුත් කරනු ලැබේ.

# 第 5　難民旅行証明書
## 5 වන කොටස　සරණාගත සංචාරක ලේඛනය

難民の認定を受けて在留している外国人が日本から出国しようとするときは、法務大臣から難民旅行証明書の交付を受けることができます。

සරණාගතයකු ලෙස හඳුනාගනු ලැබ ඇති, ජපානයේ පදිංචි විදේශීය ජාතිකයෙකු ජපානයෙන් බැහැරට යාමට අදහස් කරන විට, අධිකරණ අමාත්‍යවරයා විසින් ඔහු හෝ ඇය වෙත සරණාගත සංචාරක ලේඛනයක් නිකුත් කරනු ලැබිය හැකිය.

1　申請窓口

1　අයදුම් කිරීමේ කවුළුව

難民旅行証明書の交付申請の窓口は、難民認定申請の窓口（第 3 の 1 の（2）参照。）と同じです。申請は本人出頭が原則ですが、申請者が 16 歳未満の場合や病気その他の理由により自ら出頭することができない場合は、父母、配偶者、子又は親族がその者に代わって申請を行うことができます。この場合において、代理申請者は、旅券、在留カード等、出生証明書、住民票の写し等代理資格を疎明する資料を提示してください。

සරණාගත සංචාරක ලේඛනයක් සඳහා අයදුම් කිරීමේ කවුළුව සරණාගතයකු ලෙස හඳුනාගනු ලැබීමට අයදුම් කිරීමේ කවුළුවම වේ (3, 1, (2) වගන්තිය බලන්න). මූලික වශයෙන් අයදුම්පත් පෞද්ගලිකව භාර දෙනු ලැබිය යුතු නමුදු, අයදුම්කරු වයස අවුරුදු 16 ට අඩු නම් හෝ අසනීප බව හෝ වෙනත් හේතු මත පුද්ගලිකව පෙනී සිටීමට නොහැකි නම්, මවට හෝ පියාට, කලත්‍රයාට, දරුවෙකුට හෝ ඥාතියෙකුට ඔහු හෝ ඇය වෙනුවෙන් අයදුම් කළ හැකිය. එවන් අවස්ථාවකදී, නියෝජිත අයදුම්කරු සිය විදේශ ගමන් බලපත්‍රය, නේවාසික කාඩ්පත, උප්පැන්න සහතිකය හෝ නේවාසික ලියාපදිංචියේ පිටපතක් ආදී නියෝජිතයාගේ සුදුසුකම් සනාථ කරන ලියකියවිලි පෙන්විය යුතුය.

2　申請に必要な書類

2　අයදුම් කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි

(1)　提出書類

(1)　භාර දිය යුතු ලියකියවිලි

ア　難民旅行証明書交付申請書（入管庁ホームページに掲載されているほか、窓口でも配布しています。）　1 通

සරණාගත සංචාරක ලේඛනයක් සඳහා අයදුම්පත (මෙය ආගමන කාර්යාංශයේ වෙබ් අඩවියේ මුල්පිටුවෙහි පළ කරනු ලැබ ඇති අතර කවුළුවෙන් ද ලබා ගත හැකිය.)　පිටපත් 1 ක්

イ　写真（提出の日前 6 か月以内に撮影された 4.5 cm × 3.5 cm の無帽、正面上半身のもので、裏面に氏名及び生年月日が記載されているもの。）　2 葉

ඡායාරූපයක් (4.5cm x 3.5cm ප්‍රමාණයේ, හිස්වැසුමක් නොමැතිව සහ සිරුරේ ඉදිරිපස ඉහළ කොටස පෙනෙන ලෙස භාර දෙනු ලබන දිනයට පෙර මාස 6 ක් ඇතුළත ගන්නා ලද සහ නම සහ උපන්දිනය පිටුපස ලියන ලද) පිටපත් 2 ක්

ウ　難民旅行証明書（既に交付を受けている場合）

සරණාගත සංචාරක ලේඛනය (දැනටමත් නිකුත් කරනු ලැබ ඇත්නම්)

エ　難民旅行証明書の交付を受けている者が同証明書を提出できない場合にあっては、その理由を記載した書類　1通

සරණාගත සංචාරක සහතිකයක් ලබා ඇති පුද්ගලයෙකුට එය ඉදිරිපත් කිරීමට නොහැකි අවස්ථාවක දී නම්, ඊට හේතුව සඳහන් කරන ලියවිල්ලක්　පිටපත් 1 ක්

オ　旅券又は在留資格証明書を提示できない者にあっては、その理由を記載した書類　1通

විදේශ ගමන් බලපත්‍රය හෝ පදිංචිය පිළිබඳ තත්ත්වය සනාථ කරන ලේඛනයක් ඉදිරිපත් කිරීමට නොහැකි පුද්ගලයෙකු සඳහා, ඊට හේතුව සඳහන් කරන ලියවිල්ලක්　පිටපත් 1 ක්

(2) 提示書類

(2) පෙන්විය යුතු ලියකියවිලි

ア　難民認定証明書

සරණාගතයකු ලෙස හඳුනාගනු ලැබීමේ සහතිකය

イ　中長期在留者にあっては、旅券（日本国政府の発行した難民旅行証明書を除く。）及び在留カード

මධ්‍ය-දීර්ඝකාලීන පදිංචිකරුවන් සඳහා, විදේශ ගමන් බලපත්‍රය (ජපන් රජය විසින් නිකුත් කරන ලද සරණාගත සංචාරක ලේඛනය හැර) සහ නේවාසික කාඩ්පත

ウ　特別永住者にあっては、旅券及び特別永住者証明書

විශේෂ ස්ථිර පදිංචිකරුවන් සඳහා, විදේශ ගමන් බලපත්‍රය සහ විශේෂ ස්ථිර පදිංචි සහතිකය

エ　中長期在留者及び特別永住者以外の者にあっては、旅券又は在留資格証明書

මධ්‍ය-දීර්ඝකාලීන පදිංචිකරුවන් සහ විශේෂ ස්ථිර පදිංචිකරුවන් හැර වෙනත් අය සඳහා, විදේශ ගමන් බලපත්‍රය හෝ පදිංචිය පිළිබඳ තත්ත්වය සනාථ කරන සහතිකය

（注）代理申請の場合であっても、申請者本人の在留カードや旅券などの提示が必要になります。代理人が在留カードや旅券などを預かっている間、代理人はこれらの写しを作成し、適宜、代理人の氏名及び代理人による手続中である旨を記載の上、申請者にこれらの写しを携帯させるようにしてください。

(සැලකිය යුතුයි) නියෝජිතයකු හරහා අයදුම් කරනු ලබන අවස්ථාවක දී පවා, අයදුම්කරුගේ නේවාසික කාඩ්පත, විදේශ ගමන් බලපත්‍රය යනාදිය පෙන්වීම අවශ්‍ය වේ. නියෝජිතයා අයදුම්කරුගේ නේවාසික කාඩ්පත, විදේශ ගමන් බලපත්‍රය යනාදිය තමා ළඟ තබාගෙන සිටින කාලය අතරතුරේ දී එම ලේඛනවල පිටපත් ලබා ගෙන, තමාගේ නම සහ අයදුම් කිරීමේ ක්‍රියාවලිය තමා විසින් සිදු කරනු ලබන බව ඒවායෙහි සඳහන් කළ යුතු අතර, සුදුසු පරිදි, එම පිටපත් අයදුම්කරු සමීපයේ නිතර තබා ගන්නට සැලැස්විය යුතුය.

## 3　難民旅行証明書の有効期間

## 3　සරණාගත සංචාරක ලේඛනයේ වලංගුභාවය

難民旅行証明書の有効期間は、難民旅行証明書の発行の日から 5 年です。有効期間中は、原則として何度でも日本から出国し、日本に再入国することができます。ただし、日本での在留期間の残りが 5 年未満の場合等で、難民旅行証明書の有効期間とは別に「日本に入国できる期限」が定められているときは、その期限までに日本に再入国しなければなりません。日本に再入国できる期限は、難民旅行証明書の 3 ページに記載されていますので、必ずこれを確認し、難民旅行証明書の有効期間と混同することのないように注意してください。

සරණාගත සංචාරක ලේඛනයේ වලංගුභාවය නිකුත් කරන ලද දින සිට වසර 5 කි. එහි වලංගු කාලය තුළ, මූලික වශයෙන්, කැමති තරම් වාර ගණනක් ජපානයෙන් පිටව ගොස් නැවත ජපානයට ඇතුළු වීමට හැකිය. එසේ වෙතත්, ජපානයේ රැඳී සිටීමට ඉතිරි වී ඇති කාලය වසර 5 කට වඩා අඩු අවස්ථා ආදියේ දී සහ "ජපානයට ඇතුළුවීම සඳහා අවසාන දිනය" සරණාගත සංචාරක ලේඛනයේ වලංගු කාලසීමාවෙන් වෙනස් දිනයක් ලෙස නියම කරනු ලැබ ඇති විට, එම අවසාන දිනය ඉකුත් වන්නට පෙර නැවත ජපානයට ඇතුළු විය යුතුය. ජපානයට නැවත ඇතුළුවීම සඳහා වන අවසාන දිනය සරණාගත සංචාරක ලේඛනයේ 3 වන පිටුවේ දක්වනු ලැබ ඇති බැවින් අනිවාර්යයෙන් එය පරීක්ෂා කිරීමට ද, එසේම එය සරණාගත සංචාරක ලේඛනයේ වලංගු කාලසීමාව සමඟ පටලවා නොගැනීමට ද වග බලා ගන්න.

4　手数料

4　සේවා ගාස්තු

難民旅行証明書の交付を受ける際には、所要の額を納付しなければなりません。また、外国で難民旅行証明書の有効期間の延長手続を行う場合にも、所要の手数料をその国の通貨で納付しなければなりません。

සරණාගත සංචාරක ලේඛනයක් ලබා ගන්නා විට විට, ඒ සඳහා අවශ්‍ය ගාස්තුව ගෙවිය යුතුය. ඊට අමතරව, විදේශ රටක දී එකී සරණාගත සංචාරක ලේඛනයේ වලංගු කාලය දීර්ඝ කරවා ගැනීමට අයදුම් කරන විට, ඒ සඳහා අවශ්‍ය ගාස්තුව එම රටේ භාවිත මුදලින් ගෙවිය යුතුය.

# 第 6　一時庇護のための上陸許可
## 6 වන කොටස　තාවකාලික සරණාගතභාවය පතා ගොඩබැසීමේ අවසරය

一時庇護のための上陸許可は、船舶等に乗っている外国人が難民条約に規定する理由その他これに準ずる理由により、難民に該当する可能性がある場合、又は船舶等に乗っている外国人が補完的保護対象者に該当する可能性がある場合であって、その外国人を一時的に上陸させることが相当であると思料するときに、入国審査官が許可するもので、これは、「国が取り急ぎ保護する（領土的庇護）」ための緊急措置として与えられるものです。

තාවකාලික සරණාගතභාවය පතා ගොඩබැසීමේ අවසරය යනු, යාත්‍රාවක ආදියෙහි නැඟී සිටින විදේශිකයකු සරණාගත සම්මුතියේ නිශ්චිතව දක්වා ඇති හේතු හෝ වෙනත් සමාන හේතු මත සරණාගතයකු ලෙස සලකනු ලැබිය හැකි විට, නැතහොත් යාත්‍රාවක ආදියෙහි නැඟී සිටින විදේශිකයකු අනුපූරක ආරක්ෂණය ලැබීමට සුදුසුකම් සහිත පුද්ගලයෙකු ලෙස සලකනු ලැබිය හැකි විට සහ එකී විදේශිකයාට තාවකාලිකව ගොඩබැසීමට ඉඩ දීම සුදුසු යැයි සලකනු ලබන විට, ආගමන පරීක්ෂකවරයෙකු විසින් නිකුත් කරනු ලබන්නකි. "ක්ෂණික ආරක්ෂාව (භෞමික සරණාගතභාවය) සැපයීම සඳහා රාජ්‍යයකට ඉඩ ලැබෙන" ඉක්මන් පියවරක ස්වභාවයෙන් මෙම අවසරය ලබා දෙනු ලැබේ.

1　申請

1　අයදුම් කිරීම

(1)　対象者

(1)　සුදුසුකම් ලත් පුද්ගලයින්

船舶又は航空機に乗っている外国人

යාත්‍රාවක හෝ ගුවන් යානයක නැඟී සිටින විදේශිකයින්

(2)　申請方法

(2)　අයදුම් කරන පිළිවෙළ

到着した空海港に所在する出入国在留管理官署において、申請者本人が自ら申請してください。ただし、申請者が 16 歳未満である場合や病気その他の理由により自ら申請できない場合は、申請者に同行する父母、配偶者、子又は親族その他の同行者等が代わって申請を行うことができます。

අයදුම්කරුවන් ඔවුන් ළඟා වන ගුවන් තොටුපළෙහි හෝ මුහුදු තොටුපළෙහි පිහිටි ආගමන කාර්යාලයේ දී පුද්ගලිකව අයදුම් කළ යුතුය. කෙසේ වෙතත්, අයදුම්කරුට වයස අවුරුදු 16 ට අඩු වීම හෝ අසනීප බව හෝ වෙනත් හේතු මත පුද්ගලිකව අයදුම් කිරීමට නොහැකි නම්, අයදුම්කරු සමඟ සිටින මවට හෝ පියාට, කලත්‍රයාට, දරුවෙකුට, ඥාතියෙකුට හෝ ඔහු කැටුව යන වෙනත් පුද්ගලයෙකුට ඔහු වෙනුවෙන් අයදුම් කළ හැකිය.

2　申請に必要な書類

2　අයදුම් කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි

(1)　提出書類

(1)　භාර දිය යුතු ලියකියවිලි

ア　外国人入国記録（通常 E/D カードと呼ばれています。航空機内で配布される場合もありますが、空港の場合であれば、航空会社のカウンターや入国審査ブースで入手することがで

きます。） 1通

විදේශිකයකු ගොඩබැසීමේ වාර්තාව (සාමාන්‍යයෙන් E/D කාඩ්පතක් ලෙස හැඳින්වෙන මෙය එය ගුවන්යානය තුළ දී බෙදා හරිනු ලැබේ. නමුත් ගුවන් තොටුපළ තුළ දී නම් එය ගුවන්සේවා කවුන්ටරයෙන් හෝ ආගමන කුටියෙන් ලබා ගත හැකිය.) පිටපත් 1 ක්

イ 申告書（身分事項や申請の理由等を記載するもので、空海港に所在する出入国在留管理官署で配布しています。） 1通

ප්‍රකාශ පත්‍රය (පුද්ගලික තොරතුරු සහ අයදුම් කිරීමට හේතුව මෙහි සටහන් කරනු ලබන අතර එය ගුවන් තොටුපළෙහි හෝ මුහුදු තොටුපළෙහි පිහිටි ආගමන විගමන කාර්යාංශයේදී බෙදා හරිනු ලැබේ.) පිටපත් 1 ක්

ウ 写真（所持している場合） 2葉

ඡායාරූපයක් (සතුව ඇත්නම්) පිටපත් 2 ක්

エ 庇護を求める理由があることを証明する資料（所持している場合） 1通

සරණාගතභාවය ඉල්ලා සිටීමට හේතුවක් ඇති බව සනාථ කරන ලියකියවිලි (සතුව ඇත්නම්) පිටපත් 1ක්

(2) 提示書類

(2) පෙන්විය යුතු ලියකියවිලි

ア 旅券等の渡航文書（所持している場合）

විදේශ ගමන් බලපත්‍රය වැනි සංචාරක ලේඛනයක් (සතුව ඇත්නම්)

イ 身分を証明する文書（所持している場合）

අනන්‍යතාව සනාථ කරන ලියකියවිලි (සතුව ඇත්නම්)

3 一時庇護許可書の交付

3 තාවකාලික සරණාගත බලපත්‍රයක් නිකුත් කිරීම

審査の結果、一時庇護のための上陸が許可された場合は、一時庇護許可書が交付されます。同許可書には、上陸期間、住居及び行動範囲等の上陸のための条件が記載されます。

පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව, තාවකාලික සරණාගතභාවය පතා ගොඩබැසීම සඳහා අවසර ලැබෙන්නේ නම්, තාවකාලික සරණාගත බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ. රැඳී සිටින කාල සීමාව, පදිංචිය සහ නියැළිය හැකි ක්‍රියාකාරකම්වල පරාසය වැනි ගොඩබැසීම සඳහා වන කොන්දේසි එකී බලපත්‍රයෙහි සඳහන් වේ.

付録　難民認定手続・補完的保護対象者認定手続図解

උපග්‍රන්ථය　සරණාගතයින් හඳුනාගැනීමේ ක්‍රියාවලිය සහ අනුපූරක ආරක්ෂණලාභීන් හඳුනාගැනීමේ ක්‍රියාවලිය දැක්වෙන රූප සටහන



# සරණාගතයින් හඳුනාගැනීමේ ක්‍රියාවලිය සහ අනුපූරක ආරක්ෂණලාභීන් හඳුනාගැනීමේ ක්‍රියාවලිය දැක්වෙන රූප සටහන



（難民認定申請及び補完的保護対象者認定申請の窓口）

(සරණාගතයකු ලෙස හඳුනාගනු ලැබීමට අයදුම් කිරීමේ සහ අනුපූරක ආරක්ෂණලාභියකු ලෙස හඳුනාගනු ලැබීමට අයදුම් කිරීමේ කවුළු)

| | | |
|---|---|---|
| 札幌出入国在留管理局<br>සප්පොරෝ ආගමන විගමන කාර්යාංශය | | 審査部門<br>පරීක්ෂණ දෙපාර්තමේන්තුව |
| 仙台出入国在留管理局<br>සෙන්දයි ආගමන විගමන කාර්යාංශය | | 審査第一部門<br>පළමුවැනි පරීක්ෂණ දෙපාර්තමේන්තුව |
| 東京出入国在留管理局<br>තෝක්යෝ ආගමන විගමන කාර්යාංශය | | 難民調査第一部門<br>පළමුවැනි සරණාගත විමර්ශන දෙපාර්තමේන්තුව |
| | 成田空港支局<br>නරිතා ගුවන් තොටුපළ ශාඛා කාර්යාලය | 審査管理部門<br>පරීක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව |
| | 羽田空港支局<br>හනෙදා ගුවන් තොටුපළ ශාඛා කාර්යාලය | 審査管理部門<br>පරීක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව |
| | 横浜支局<br>යොකොහමා ශාඛා කාර්යාලය | 就労・永住審査部門<br>රැකියා නියුක්තිය සහ ස්ථිර පදිංචිය පරීක්ෂා කිරීමේ දෙපාර්තමේන්තුව |
| 名古屋出入国在留管理局<br>නගොයා ආගමන විගමන කාර්යාංශය | | 難民調査部門<br>සරණාගත විමර්ශන දෙපාර්තමේන්තුව |
| | 中部空港支局<br>චුබු ගුවන් තොටුපළ ශාඛා කාර්යාලය | 審査管理部門<br>පරීක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව |
| 大阪出入国在留管理局<br>ඕසකා ආගමන විගමන කාර්යාංශය | | 永住審査部門<br>ස්ථිර පදිංචිය පරීක්ෂා කිරීමේ දෙපාර්තමේන්තුව |
| | 関西空港支局<br>කන්සයි ගුවන් තොටුපළ ශාඛා කාර්යාලය | 審査管理部門<br>පරීක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව |
| | 神戸支局<br>කෝබෙ ශාඛා කාර්යාලය | 審査部門<br>පරීක්ෂණ දෙපාර්තමේන්තුව |
| 広島出入国在留管理局<br>හිරොෂිමා ආගමන විගමන කාර්යාංශය | | 就労・永住審査部門<br>රැකියා නියුක්තිය සහ ස්ථිර පදිංචිය පරීක්ෂා කිරීමේ දෙපාර්තමේන්තුව |
| 高松出入国在留管理局<br>තකමත්සු ආගමන විගමන කාර්යාංශය | | 審査部門<br>පරීක්ෂණ දෙපාර්තමේන්තුව |
| 福岡出入国在留管理局<br>ෆුකුඔකා ආගමන විගමන කාර්යාංශය | | 審査管理部門<br>පරීක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව |
| | 那覇支局<br>නහා ශාඛා කාර්යාලය | 審査部門<br>පරීක්ෂණ දෙපාර්තමේන්තුව |

（審査請求の窓口）

(සමාලෝචන ඉල්ලීම් කවුළු)

| | | |
|---|---|---|
| 札幌出入国在留管理局<br>සප්පොරෝ ආගමන විගමන කාර්යාංශය | | 審査部門<br>පරීක්ෂණ දෙපාර්තමේන්තුව |
| 仙台出入国在留管理局<br>සෙන්දයි ආගමන විගමන කාර්යාංශය | | 審査第二部門<br>දෙවන පරීක්ෂණ දෙපාර්තමේන්තුව |
| 東京出入国在留管理局<br>තෝක්යෝ ආගමන විගමන කාර්යාංශය | | 難民審判部門<br>සරණාගත විමර්ශන දෙපාර්තමේන්තුව |
| | 成田空港支局<br>නරිතා ගුවන් තොටුපළ ශාඛා කාර්යාලය | 第二審判部門<br>දෙවන විමර්ශන දෙපාර්තමේන්තුව |
| | 羽田空港支局<br>හනෙදා ගුවන් තොටුපළ ශාඛා කාර්යාලය | 審判部門<br>විමර්ශන දෙපාර්තමේන්තුව |
| | 横浜支局<br>යොකොහමා ශාඛා කාර්යාලය | 審判部門<br>විමර්ශන දෙපාර්තමේන්තුව |
| 名古屋出入国在留管理局<br>නගොයා ආගමන විගමන කාර්යාංශය | | 難民審判部門<br>සරණාගත විමර්ශන දෙපාර්තමේන්තුව |
| | 中部空港支局<br>චුබු ගුවන් තොටුපළ ශාඛා කාර්යාලය | 審査管理部門<br>පරීක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව |
| 大阪出入国在留管理局<br>ඕසකා ආගමන විගමන කාර්යාංශය | | 審判部門<br>විමර්ශන දෙපාර්තමේන්තුව |
| | 関西空港支局<br>කන්සයි ගුවන් තොටුපළ ශාඛා කාර්යාලය | 審判部門<br>විමර්ශන දෙපාර්තමේන්තුව |
| | 神戸支局<br>කෝබෙ ශාඛා කාර්යාලය | 審査部門<br>පරීක්ෂණ දෙපාර්තමේන්තුව |
| 広島出入国在留管理局<br>හිරොෂිමා ආගමන විගමන කාර්යාංශය | | 審判部門<br>විමර්ශන දෙපාර්තමේන්තුව |
| 高松出入国在留管理局<br>තකමත්සු ආගමන විගමන කාර්යාංශය | | 審査部門<br>පරීක්ෂණ දෙපාර්තමේන්තුව |
| 福岡出入国在留管理局<br>ෆුකුඔකා ආගමන විගමන කාර්යාංශය | | 審判部門<br>විමර්ශන දෙපාර්තමේන්තුව |
| | 那覇支局<br>නහා ශාඛා කාර්යාලය | 審査部門<br>පරීක්ෂණ දෙපාර්තමේන්තුව |